**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය**

**ආරක්ෂක අමාත්‍යාංශය**

# ඇබෑර්තු

## ආසියානු යටිතල පහසුකම් සඳහා වන ආයෝජන බැංකුව අරමුදල් සපයන ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP)

ආසියානු යටිතල පහසුකම් සඳහා වන ආයෝජන බැංකුව විසින් අරමුදල් සපයනු ලබන ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වනුයේ ආරක්ෂක අමාත්‍යාංශ යටතේ ඇති ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වේ. මෙම ව්‍යාපෘතිය යටතේ බදුල්ල, මහනුවර, මාතලේ, කෑගල්ල, රත්නපුර, නුවරඑළිය, කළුතර, ගාල්ල, මාතර, හම්බන්තොට සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල නායයෑම් අවම කිරීමේ වැඩ (ස්ථාන 126 ක) සහ දුම්රිය මාර්ගය දිගේ අස්ථාවර ස්ථාන වැඩිදියුණු කරනු ලැබේ. එයින් ඉතා අවදානම් ස්ථාන 24 ක අවම කිරීම / ප්‍රතිශෝධනය I වන අධියර යටතේද ඉතිරි ස්ථානවල II වන අධියර යටතේද අවම කිරීම් / ප්‍රතිශෝධන කටයුතු සිදු කෙරේ.

### 01. ප්‍රසම්පාදන විශේෂඥ (තනතුරු - 01 - PS 3 මට්ටම)

**තනතුරේ සාරාංශය**

ඔහු / ඇය සම්පූර්ණ ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු හා කොන්ත්‍රාත් පරිපාලන කටයුතු කළමනාකිරීම සම්බන්ධයෙන් වග කියයි.

අ) සිවිල් ඉංජිනේරු / ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධියක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් අදාළ ක්ෂේත්‍රයක හෝ සිවිල් ඉංජිනේරු / ප්‍රමාණ සමීක්ෂණ හෝ ඕනෑම අනෙකුත් අදාළ ක්ෂේත්‍රයක උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක් හෝ සිවිල් ඉංජිනේරු / ප්‍රමාණ සමීක්ෂණ හෝ ඕනෑම අනෙකුත් අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / සමාන වෘත්තීය සදුසුකමක්

සමග

කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර 12 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් තිබීම.

හෝ

ආ) සිවිල් ඉංජිනේරු / ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධිය සාර්ථකව සම්පූර්ණ කර තිබීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් අදාළ ක්ෂේත්‍රයක හෝ සිවිල් ඉංජිනේරු / ප්‍රමාණ සමීක්ෂණ හෝ ඕනෑම අනෙකුත් අදාළ ක්ෂේත්‍රයක උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සුදුසුකමක් හෝ සිවිල් ඉංජිනේරු / ප්‍රමාණ සමීක්ෂණ හෝ ඕනෑම අනෙකුත් අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක් / සමාන වෘත්තීය සුදුසුකමක් සමග සිවිල් ඉංජිනේරු විද්‍යාවේ / ප්‍රමාණ සමීක්ෂණ විද්‍යාව පිළිබඳ හෝ අනෙකුත් අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබීම හෝ සිවිල් ඉංජිනේරු / ප්‍රමාණ සමීක්ෂණ හෝ ඕනෑම අනෙකුත් අදාළ ක්ෂේත්‍රයක පිළිගත් වෘත්තීය ආයතනයක් වෙතින් ආයතනික / වරලත් සාමාජිකත්වයක් හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම සමග කළමනාකාර මට්ටමේ අවම වශයෙන් වසර 09 ක පශ්චාත් සුදුසු පළපුරුද්දක් තිබීම

හෝ

ඇ) රජයේ දීප ව්‍යාප්ත සේවයේ 1 වන ශ්‍රේණියේ නිලධාරියෙකු වීම හෝ සිවිල් ඉංජිනේරු / ප්‍රමාණ සමීක්ෂණ හෝ ඕනෑම අනෙකුත් අදාළ ක්ෂේත්‍රයේ සමාන තත්ත්වයක නිලධාරියෙකු වීම සමග 1 වන පංතියේ තනතුරක අවම වශයෙන් වසර 04 ක පළපුරුද්දක් තිබීම

**වයස :** 2022.11.15 වෙනි දිනට වයස අවුරුදු 64 ට අඩු වීම

**පොදු කොන්දේසි**

කොන්ත්‍රාත් පදනම මත මූලිකව වසරක කාලයක් සඳහා බඳවා ගනු ලබන අතර සාර්ථක කාර්ය සාධනයට යටත්ව වාර්ෂිකව සේවාව අලුත් කළ හැකිය. රාජ්‍ය සේවයේ / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / සංස්ථාවක හෝ අනෙකුත් රාජ්‍ය ආයතනයක සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත අදාළ ආයතන ප්‍රධානී මගින් ඉදිරිපත් කළ යුතු අතර, ආයතන ප්‍රධානියා විසින් ඔහු / ඇය මෙම තනතුරට තෝරාගත හොත් සේවයෙන් මුදා හැරීමට / මුදා හැරීමට නොහැකි බව සඳහන් කර තිබිය යුතුය.

සේවකයා විසින් මාසික වැටුපෙන් 10% ක් සේවක අර්ථ සාධක අරමුදලට දායකත්වයක් ලබා දිය යුතු අතර, සේවා යෝජක විසින් සේවක අර්ථ සාධක අරමුදලට 12% ක හා සේවක භාරකාර අරමුදලට 3% ක දායකත්වයක් ලබා දෙනු ඇත.

**වැටුප :**

අංක 01/2019 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය සහ අනෙකුත් අදාළ කළමනාකරණ සේවා චක්‍රලේඛ පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**අයදුම්පත් ඉදිරිපත් කිරීම**

සම්පූර්ණ ජීව දත්ත. ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා සම්බන්ධ කරගත හැකි විස්තර සහිතව අදාළ සහතිකවල පිටපත් සමග ඔබේ අයදුම්පත් මෙම දැන්වීම් දිනයේ සිට දින 10 ක් ඇතුළත ඉදිරිපත් කරන්න.

අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කර පහත සඳහන් ලිපිනය වෙත ලියාපදිංචි තැපැල් මගින් යොමු කරන්න.

(නිසි ලෙස සම්පූර්ණ නොකළ අයදුම්පත් හා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද සපුරා නොමැති හා අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ)

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් නායයෑමේ අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය,**
**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය,**
**99/1, ජාවත්ත පාර, කොළඹ 05.**
**(දුරකථනය : 0112559869)**